# මූලික පිරිවෙන් වර්ෂාවසාන විභාගය - 2013.

## ත්‍රිපිටක ධර්මය

5 වසර | I පත්‍රය | කාලය පැ 3 යි.

---

* I කොටසේ ප්‍රශ්න සියල්ලටත් II හා III වන කොටස් වලින් යටත් පිරිසෙන් ප්‍රශ්න 02 ක් වත් ඇතුළත් වන සේ ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය ප්‍රකට වන අවස්ථා 04 ක් ලියන්න.

ii. අෂ්ට විද්‍යාඥාන නම් කරන්න.

iii. සිව්වන ධර්ම සංගායනාවට සහභාගී වූ මහ තෙරවරුන් තෙනමක් නම් කරන්න.

iv. අක්කෝසක භාරද්වාර බමුණා හා බුදුරදුන් අතර වූ දෙබසින් බුදුරදුන්ගේ කිනම් ගුණයක් ප්‍රකට වේ ද ?

v. තුන් ආකාර විමෝක්ෂය හඳුන්වන්න.

vi. බුදුරදුන්ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ අතරින් 05 ක් ලියන්න.

vii. පූතිගත්තතිස්ස හිමි ඒ නමින් හැඳින්වුයේ කවර හෙයින් ද ?

viii. වංගීස තෙරුන් සැරියුත් තෙරුණුවන් පිළිබඳ දෙසු විශේෂ ගුණ 02 ක් ලියන්න.

ix. සරණංකර සංඝරාජ හිමිපාණන් මූලික වී ආරම්භ කළ විද්‍යාපීඨ 02 ක් නම් කරන්න.

x. පුද්ගලයා තුළ පහලවන්නා වූ ආසවධර්ම කවරේ ද ? (4x10 = 40)

## II කොටස

(02) i. මහා කරුණා සමාපත්ති ඥානය හඳුන්වන්න.

ii. බුදු දහමේ සිතීමේ හා විමසීමේ නිදහස උදාහරණයකින් පැහැදිලි කරන්න.

iii. බුදුරදුන්ගේ පුරිසදම්ම සාරථී ගුණය නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (5x3 = 15)

(03) පහත සඳහන් ගාථා සම්පූර්ණ කොට ඒවායෙහි අර්ථය පැහැදිලි කරන්න.

i. යස්සින්ද්‍රියානි සමථං ගතානි

ii. පාණිම්හි චෙ වණෝ නාස්ස

iii. උදකං හි නයන්ති නෙත්තිකා (5x3 = 15)

(04) i. කාලාම සූත්‍රයේ දැක්වෙන යමක් නිවැරදි ව පිළිගතයුතු නොපිළිගතයුතු ක්‍රමය කුමක් ද ?

ii. සමජීවිකතා යන්නෙහි අදහස පැහැදිලි කරන්න.

iii. මිත්‍ර ප්‍රතිරූපකයෝ සිව් දෙනා නම් කොට ඉන් එක් අයෙකු හඳුන්වන්න. (5x3 = 15)

(05) i. ප්‍රථම දෙවන තෙවන සංගායනා පැවැත්වීමට බලපෑ හේතු සංක්ෂිප්තව වෙන වෙන ම ලියන්න.

ii. කාලාශෝක සහ ධර්මාශෝක රජ සමයන් අතර භික්ෂු සමාජය අටලොස් නිකායට ම බෙදී ගිය අයුරු දක්වන්න.

iii. කණිෂ්ක රජු පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් සපයන්න. (5x3 = 15)

## III කොටස

(06) වැලිවිට සරණංකර සංඝරාජ මාහියන්ගෙන් සිදු වු ශාසනික හා ශාස්ත්‍රීය සේවාව ඇගයීමට ලක් කරන්න. (15)

(07) ''මොලොව පරලොව යහපත අපේක්ෂා කරන පුද්ගලයාට ව්‍යග්ඝපජ්ජ සූත්‍රය අගනා ඔවදනකි''. විමසන්න. (15)

(08) පහත මාතෘකාවලින් 03 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. බුදුරදුන්ගේ තාදි ගුණය

ii. සතර කර්ම ක්ලේශ

iii. ඛේමා තෙරණියෝ

iv. ත්‍රිලක්ෂණය

v. බුදු සමයේ කාන්තා නිදහස (5x3 = 15)

(09) පව් දුරලා යහපත් ජීවිතයක් ගත කිරීමට ධම්මපදයේ පාප වග්ගයෙන් පිටුබලය කෙබඳු දැයි විස්තර කරන්න. (15)